Department of Education,Sabaragamuwa Province/ Weekly School

## 3වන වාරය - පුනරීක්ෂණ අභ්‍යාස

**හිස්තැන් සම්පූර්ණ කරමින් අධ්‍යයනය කරන්න.**

පදාර්ථයේ සිදුවන වෙනස්වීම්, භෞතික විපර්යාස හා රසායනික විපර්යාස ලෙස ආකාර දෙකකි.

- **භෞතික විපර්යාස** - යම් පදාර්ථයක සංයුතිය වෙනස්කමකට ලක් නොවී, එහි පවතින අංශුවල සැකැස්ම/ පවතින ස්වභාවය පමණක් වෙනස්වීම.

උදා - 1. කඩදාසියක් කුඩා කැබලි වලට වෙන් කිරීම.

2 .---------------------------------------------

3.---------------------------------------------

- **රසායනික විපර්යාස** - යම් පදාර්ථයක සංයුතිය වෙනස් වී නව ද්‍රව්‍ය සෑදීම.

උදා -: 1. කඩදාසි කොළයක් දහනය කලවිට නව ද්‍රව්‍යයක් වන අළු සහ දුම් සෑදීම.

2. --------------------------------------------------------

3.---------------------------------------------------------

- රසායනික ප්‍රතික්‍රියාවක් සිදු වූ බව තහවුරු කිරීමට සාක්ෂි ඇත.

ඒවා නම් - : 1. රත්වීම.

2. වායු බුබුලු පිට වීම.

3.-------------------------

4.--------------------------

5.--------------------------

රසායනික විපර්යාස සඳහා සහභාගීවන ද්‍රව්‍ය **ප්‍රතික්‍රියක** ලෙසද, රසායනික විපර්යාසය මගින් ඇතිවන ද්‍රව්‍ය **ඵල** ලෙස ද හැඳින්වේ.

**ප්‍රතික්‍රියක** ⟶ ඵල

- **පහත සඳහන් පරීක්ෂණ සළකා බලමින් දී ඇති වගුව සම්පූර්ණ කරන්න.**

පරීක්ෂණ අංක 1 - මැග්නීසියම් පටි කැබැල්ලක් ඬැහි අඩුවෙන් අල්ලා දහනය කළ විට දීප්තිමත් දැල්ලක් සහිතව දැල්වේ. අවසානයේ සුදු කුඩක් ඉතිරි වේ.

.

$$2Mg + O_2 \longrightarrow 2MgO$$

පරීක්ෂණ අංක 2 - දම් පාට පොටෑසියම් පර්මැංගනේට් කැට ස්වල්පයක් කැකෑරුම් නලයකට දමා රත්කර, නලය තුළට පුලිඟු කීරක් ඇතුල් කල විට එය දීප්තිමත්ව දැල්වේ.

$$2KMnO_4 \xrightarrow{\triangle} K_2MnO_4 + MnO_2 + O_2$$

පරීක්ෂණ අංක 3 - නිල්පාට කොපර් සල්ෆේට් ද්‍රාවණයකට සින්ක් ලෝහ කැබැල්ලක් දැමූවිට, පෙර තිබූ නිල් පාට ක්‍රමයෙන් අඩුවී දුඹුරු පැහැ වේ.

$$CuSO_4 + Zn \longrightarrow ZnSO_4 + Cu$$

පරීක්ෂණ අංක 4 - අවර්ණ බේරියම් ක්ලෝරයිඩ් ද්‍රාවණ ස්වල්පයක් පරීක්ෂණ නළයකට ගෙන එයට සෝඩියම් සල්ෆේට් ද්‍රාවණ ස්වල්පයක් දැමූවිට සුදු පැහැති අවක්ෂේපයක් ලැබේ.

$$BaCl_2 + Na_2SO_4 \longrightarrow BaSO_4 + 2NaCl$$

| පරීක්ෂණය | ප්‍රතික්‍රියක වල ස්වභාවය | ඵල වල ස්වභාවය |
|---|---|---|
| අංක 1 | රිදී පාට ලෝහයකි. | සුදු පාට කුඩකි. |
| අංක 2 | | |
| අංක 3 | | |
| අංක 4 | | |

- **ගැළපෙන පරීක්ෂණ අංකය ඉහළින් තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.**

➢ පරීක්ෂණ අංක .................... රසායන වියෝජන ප්‍රතික්‍රියාව කි.

➢ පරීක්ෂණ අංක .................. යනු රසායනික සංයෝජන ප්‍රතික්‍රියාවකට උදාහරණයකි.

➢ ඒක විස්ථාපන ප්‍රතික්‍රියාවක් වන්නේ පරීක්ෂණ අංක .................... ය.

➢ ද්විත්ව විස්ථාපන ප්‍රතික්‍රියාවකට උදාහරණයක් වන්නේ පරීක්ෂණ අංක .................. ය.